**ගල්ගමුව ප්‍රාදේශීය සභාව - 2021**
**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ගල්ගමුව ප්රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**
**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1** **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතුව පැවති ඉඩම් හා ගොඩනැගිලි 20 ක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබීම නිසා ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුම එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය වාර්තාවට මෙකී වත්කම්වල වටිනාකම් ඇතුළත් කර ගැනීමට කටයුතු කරමි. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැගිලි 06 ක් සංවර්ධනය සඳහා දරා තිබුණු රු.19,122,485ක මුදලක් හා වර්ෂය තුල මිලදීගෙන තිබූ රු. 187,196 ක් වටිනා උපකරණ, ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුම රු.19,309,681ක් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරගැනීමට කටයුතු කරමි. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා ලැබී තිබූ රු.839,900ක මුද්දර ගාස්තු ආදායම හා 2021 වර්ෂයේ අවසන් මාස තුනේ මුද්දර ගාස්තු ආදායම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණු බැවින් මුද්දර ගාස්තු ආදායම අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය වාර්තාවට ඇතුළත් කිරීමට මෙය සටහන් කර ගතිමි. | නිවැරදිව ගිණුම් තැබීම කළ යුතුවේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළ වැටුප් ප්‍රතිපූර්ණය රු.65,071,751 ක් වුවද එය ආදායම් වියදම් ගිණුමේ රු.64,870,201 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වැටුප් ප්‍රතිපූර්ණය රු.201,550 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | |
| (ඉ) | 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රු.116,706 ක යන්ත්‍ර කුලියට ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු මුදලක් පියවා තිබියදී තවදුරටත් එම වටිනාකම ඉවත් නොකර ණයහිමි ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු සිදුකරන බව දන්වා සිටිමි. | |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,186,601 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,641,946 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු වෙළඳපල බිම් මහල කඩ කාමර 23 කින් රු.358,909ක කඩ කුලී හා රු.62,970 ක දඩ මුදලක් අයකර නොතිබුණි. | මේ සියලු හිඟ කුලී මුදල් අයකරගැනීම සඳහා නීතිමය කටයුතු වෙත යොමු කර ඇත. | බදුකුලී කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | බස් නැවතුම්පල වටා කඩ කාමර 45 ක් පවතින අතර මෙම කඩ කාමර තක්සේරු කර නොතිබුණු බවත් කඩ කාමර 17 කින් වසරකට වඩා වැඩි කාලයක සිට අයවිය යුතු කුලිය රු.86,571 ක් අයකර නොතිබුණි. | හිග මුදල වන රුපියල් 86,571 ක මුදල ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. | කඩ කුලී කාලීනව තක්සේරු කර හිඟ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සභාවේ වාර්ෂික ටෙන්ඩර් මත බදු දීම්වලට අදාළව වසර 03 සිට වසර 05 ත් අතර කාලයක සිට අවස්ථා 08 කදී අය නොවී පවතින රු. 1,353,974 ක බදු කුලී මුදලක් හා ඊට අදාළ වූ රු.24,405ක හිඟ දඩ මුදලක් අයකර නොතිබුණි. | හිග මුදල වන්නේ රු.1,353,974 කි. එම හිග මුදල හා හිග දඩ මුදල ලබා ගැනීම සඳහා නීතිමය වශයෙන් කටයුතු කර ඇත. | අතුරු බදුදීම් පිළිබඳ සොයා බලා නීත්‍යානුකූලව කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | පොදු වෙළඳපල කඩ කාමර 08කින් අයකළ යුතු රු.2,758,309 ක පෙර ගෙවුම් මුදලක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයවිය යුතු මුදල වන රු.2,758,309 ක මුදල කඩිනමින් අයකරගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | එකවර ගෙවීමේ මුදල් කාලීනව අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගල්ගමුව නගරයේ අරසන් වැව, වාන් ඇළ, රක්ෂිතය තුළ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ හිටපු උප සභාපතිවරයෙකු ප්‍රාදේශීය සභාවේ අනුමැතියකින් තොරව අනවසරයෙන් | අනවසර ඉදිකිරීමක් හේතුවෙන් එම ඉදිකිරීම් සම්බන්ධයෙන් නාගරික | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග |

| | |
|---|---|
| විශාල ප්‍රමාණයේ ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ බව නිරීක්ෂණය විය. මේ වන විට නඩු පවරා ඇතත්, ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් ඉදිකර බද්දට දී තිබූ බවත් අදාළ ආයතනවල බලධාරීන් කාලානුරූපව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බවත් නිරීක්ෂණය විය. | සංවර්ධන අධිකාරිය මඟින් නීතිමය පියවර ගෙන ඇත. | ගත යුතු වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගල්ගමුව නගරයේ ඉන්ධන පිරවුම්හල අසල පොදු ළිඳක් ඉදිකිරීම සඳහා 1967 වර්ෂයේදී පරිත්‍යාග කර තිබූ වර්ග අඩි 400 ක පමණ ඉඩම වසර 25 ක කාලයකට බදු දීමට සභා අනුමැතිය හා විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන තිබුණේ ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ඉදිකර බදු දීමට වුවත්, බදුකරුට ගොඩනැගිල්ල ඉදිකර ගැනීමට අවස්ථාව ලබා දී තිබුණි. බදුකරු සමඟ අත්සන් කළ බදු ගිවිසුමේ 7 වන වගන්තිය ප්‍රකාරව බදුකරු ඉදිකිරීම් නොකළ යුතු බව දක්වා ඇතත් මෙම ඉඩම තුළ විශාල ගොඩනැගිල්ලක් ඉදිකර ඇති අතර, ව්‍යාපාරික ස්ථානයක්ද ඉදිකර ඇතත් සභාවේ අවසරයක් ලබා ගැනීම හෝ සභාව කිසිදු පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. මෙම ව්‍යාපාරික ස්ථානය සඳහා 2017 වර්ෂයේදී රු. 16,000 ක තක්සේරුවක් ලබා දී ඇතත් එය අයකර නොතිබුණි. මේ හේතුවෙන් 2017 මැයි සිට 2021 දෙසැම්බර් දක්වා රු.896,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | වර්ෂ 25 ක කාලයකට විෂය භාර ගරු අමාත්‍යවරයාගේ අනුමැතිය මත පර්චස් 02 ක ස්ථානය ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ඉදිකර වෙළඳ අයිතිය ලබාදී ඇත. 2017.05.25 දින කඩ තක්සේරුවක් සිදුකර ඇති අතර, එහිදී මාසික කුලී මුදල රු.16,000 ක් ලෙස දන්වා තිබුණි. එම තක්සේරු මුදල අයකර ගැනීමට කිහිපවරක් දැනුවත් කර ඇති නමුත් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ගිවිසුමකටද එළඹ නොතිබුණි. | සභාව සතු වාණිජ වටිනාකමින් යුතු ඉඩම් ගොඩනැගිලි ඉදිකර බදුදිය යුතු වුවත්, බදුකරුට ඉදිකිරීම් සිදු කර ගැනීමට අවස්ථාව ලබා දීමෙන් බදුකරු විශාල ප්‍රමාණයේ ඉදිකිරීම් සිදු කිරීමෙන් සභාවට ඉඩම අහිමිවන තත්ත්වයක් උදාවී ඇත. ඉඩමේ වටිනාකමට බදු අයකළ යුතු වේ. |

**3.3 දෘෂ්‍ය අක්‍රමිකතා**

----------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු නව බස් නැවතුම්පොළ මඟීන්ට රැඳී සිටීමට ඇති හිස් අවකාශයක අනවසරයෙන් මහල් දෙකකින් යුත් කඩ කාමරයක් ඉදිකිරීමට සැලසුම් කර දිග අඩි 20 පලළ අඩි 20 පමණ ප්‍රමාණයක කණු 06 ක් දමා කඩ කාමරය ඉදිකර slab එක දැමීමට කටයුතු කරමින් පවතින බව 2022 මැයි 04 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. සභාවේ ඉහළ | නව බස්නැවතුම්පලට යාබදව ඉදිකිරීම් සූදානම් කර ඇති කොටස මේ වනවිට නවතා ඇත. ඉදිරියේදී නාගරික සංවර්ධන අධිකාරියේ නිර්දේශයට අනුව කටයුතු කරන බව සඳහන් කරමි. | සභාව සතු බස් නැවතුම්පල හිස් අවකාශයක අනවසරයෙන් ඉදිකිරීම් සිදුකරන තෙක් සභාවේ වගකිව යුතු නිලධාරීන් පියවර නොගැනීම පිළිබඳව ආයතන සංග්‍රහය ප්‍රකාරව විනය |

| | | | |
|---|---|---|---|
| | කළමනාකරණය මෙම අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | නව බස් නැවතුම්පල අංක 04 දරණ සභාව සතු කඩ කාමරය 1993 ජුලි මාසයේදී බදුකරුවෙකුට ලබා දී තිබුණි. මෙම කඩ කාමරය සඳහා 2020 වර්ෂය වන විට රු.52,920 ක හිඟ මුදලක් ගෙවා නොතිබුණ අතර 2022 මැයි 04 පරීක්ෂණ අවස්ථාව වන විට බස් නැවතුම්පල අංක 3 හා 4 කඩ කාමර ගල්ගමුව හිටපු සභාපතිවරයෙකුගෙන් බදුකරුවකු බදු ලෙස ලබාගෙන මසකට රු.40,000 ක් ගෙවන බව නිරීක්ෂණය විය. මේ අනුව සභාව සතු දේපලක් අනවසරයෙන් අත්පත් කරගෙන එහි ස්වභාවය සම්පූර්ණයෙන් වෙනස්කර මහල් 03 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකර ඇතත් ප්‍රාදේශීය සභාවේ වගකිවයුතු නිලධාරීන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අංක 04 කඩ කාමරය සඳහා මාසික කුළී ගෙවාගෙන යන බව තහවුරු වුවත්, මාස කිහිපයක සිට නොගෙවීමේ හිඟ මුදලක් පැවතීම නිසා අදාළ මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස 2016 වර්ෂයේ ලිඛිතව දැනුවත් කරන ලදී. අදාළ ලිපියට පිළිතුරු ලෙස සභාවට හිමිකම් පෑමේ ලේඛන ඉදිරිපත් කරන ලෙස පුද්ගලයකුට 2016.05.18 ලිඛිතව දැනුම් දී ඇත. මෙම කඩ කාමරය සම්බන්ධයෙන් සන්තකය ආපසු ගැනීමට කටයුතු කළ යුතු බවත්, අනවසර ඉදිකිරීමක් වී ඇත්නම් අයිතිය තහවුරු කර ඉදිකිරීම ඉවත් කරන ලෙසත් පසුව හිඟය අයකරගැනීමට කටයුතු කළ යුතු බවත් දැනුම් දී ඇත. | සභාව සතු දේපලවල අයිතිය තහවුරු කරගෙන නීත්‍යානුකූලව කටයුතු කර සභා දේපල ආරක්ෂා කිරීමට සභාවේ වගකිව යුතු නිලධාරීන් කටයුතු කළ යුතු වේ. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ මොන්නැකුලම ආදාහනාගාරය අළුත්වැඩියාව සඳහා රු.3,252,122 ක මුදලක් වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2022 මැයි 04 දින භෞතික පරීක්ෂාවේදී ස්වභාවික ගල්වල තීන්ත මීටරයක පමණ ප්‍රමාණයක ආලේප කිරීමට රු.56,539 ක මුදලක්ද, ආදාහනාගාරයේ කුට්ටිගල්වල දෙවතාවක් තීන්ත ආලේප කිරීමට රු.753,246 ක මුදලක්ද, කුට්ටිගල් මාර්ගවල Thermoplatic paint (yellow) වලින් කහපාට තීරුවක් ඇඳීමට රු.302,454 ක මුදලක්ද වැයකර තිබුණි. | කලුගල් කොටස්වල අලංකාරය සඳහාත් කුට්ටිගල්වල අලංකාරය සඳහාත් තීන්ත ආලේප කර ඇත. | මුදල් වැයකර ඉදිකිරීම් සිදු කිරීමේදී කාර්යක්ෂමව, ආර්ථික භාවයෙන් යුතු ඵලදායී වැඩ ඉටුකළ යුතු වේ. බාහිර අලංකරණය සඳහා ස්වභාවිකව පිහිටි ගල්වල තීන්ත ආලේප කිරීම වැනි නිෂ්කාර්යය වියදම් නොකළ යුතු වේ. |
| (ආ) | 2021 වර්ෂයේදී ග්‍රාමීය හා පාසැල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත යූ.බී. වන්නිනායක ක්‍රීඩාපිටියේ ක්‍රීඩාගාරය | වැඩ විෂය 24 ප්‍රකාරව පැරණි ඇස්බැස්ටර්ස් ෂීට් දිරාපත් වී සිදුරු වී තිබූ නිසා ඒවා නැවත ප්‍රයෝජනයට ගැනීමට නොහැක. composite | නව ෂීට් යෙදූ බව තහවුරු නොවිය. බිල්පත් සඳහා ගෙවීම් කිරීමේදී නිවැරදිව මිනුම් ලබාගෙන ගෙවීම් |

ඉදිකිරීම සඳහා රු.4,948,898 ක වටිනාකමකට වැඩ නිමකර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2022 මැයි 04 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදි ඇස්බැස්ටෝස් සෙවිලි තහඩු සඳහා රු.184,642 ක් ගෙවා තිබුණද මෙම ක්‍රීඩාගාරයේ පෙර භාවිතා කර තිබූ ඇස්බැස්ටෝස් ෂීට් භාවිතා කර තිබූ බව සනාථ විය. වැඩ විෂයය අංක 30 ප්‍රකාරව මිලි මීටර 4 ඇලුමිනියම් composite panels සවි කිරීම වෙනුවෙන් රු.187,550 වැඩිපුර ගෙවීම් කර තිබුණි.

panals සවිකිරීම මිනුම්වල ඇති වී කළ යුතු වේ. ඇති දෝෂය නිවැරදි කරමි.